පාර්ලිමේන්තුව

பாராளுமன்றம்

**PARLIAMENT**

2026.08.31

ගරු වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතා,

ගරු කථානායකතුමා,

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

ගරු කථානායකතුමනි,

**<u>අගවිනිසුරුතුමා සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව තුළ මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කර ඇති බරපතළ චෝදනා සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ මට්ටමින් ගෙන ඇති හෝ ගැනීමට නියමිත ක්‍රියාමාර්ග පිළිබඳව විමසීම</u>**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ඇ) ව්‍යවස්ථාව අනුව, නීතිය අනුව පාර්ලිමේන්තුව විසින් ම ක්‍රියාත්මක කළ හැකි පාර්ලිමේන්තුවේ සහ එහි මන්ත්‍රීවරයන්ගේ වරප්‍රසාද, පරිහාර හා බලතල සම්බන්ධයෙන් විනා ජනතාවගේ අධිකරණ බලය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කොට පිහිටුවන ලද හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගන්නා ලද නැතහොත් වෙනත් යම් නීතියකින් ඇති කොට පිහිටුවන ලද අධිකරණ, විනිශ්චය අධිකාර සහ ආයතන මඟින් පාර්ලිමේන්තුව විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය.

ඒ අනුව, ශ්‍රී ලංකා අධිකරණ පද්ධතියේ ස්වාධීනත්වය, ගෞරවය සහ මහජන විශ්වාසය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවටද ඉතා වැදගත් වගකීමක් පවතින බව මාගේ විශ්වාසයයි.

මෑත දිනවල පාර්ලිමේන්තු සභා ගර්භය තුළ ගරු මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකු විසින් වත්මන් අගවිනිසුරු ගරු ප්‍රීති පද්මන් සූරසේන මහතා සම්බන්ධයෙන් බරපතළ ස්වභාවයේ කරුණු හා චෝදනා කිහිපයක් ප්‍රසිද්ධියේ ඉදිරිපත් කර තිබේ.

එම කරුණු අතර,

01. අගවිනිසුරුතුමාගේ පුත්‍රයා ලෙස සඳහන් වන දිමුතු සූරසේන මහතා සම්බන්ධයෙන් කොළඹ ප්‍රදේශයේ රුපියල් මිලියන හිමිකර ගැනීම /185ක් පමණ වටිනා මහල් නිවාසයක් ලබාගැනීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් වූ කරුණු;

02. එම දේපළ අත්පත් කරගැනීමේ ස්වභාවය, මූලාශ්‍රය සහ අදාළ වත්කම් ප්‍රකාශ සමඟ එහි ඇති සම්බන්ධතාවය පිළිබඳව මතු කර ඇති ප්‍රශ්න;

03. මන්ත්‍රීවරයෙකු විසින් පාර්ලිමේන්තුවේදී සඳහන් කර ඇති අගවිනිසුරුතුමාගේ උපන් සහතිකය, විවාහ සහතිකය සහ දරුවන්ගේ උපන් සහතික සම්බන්ධයෙන් මතු කර ඇති සැකයන් සහ චෝදනා;

04. X-Press Pearl නඩුව හා ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයට හිමිවිය යුතු වන්දි මුදල් අයකර ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අගවිනිසුරුතුමාගේ කාර්යභාරය, අධිකරණ ක්‍රියාමාර්ගවල ප්‍රගතිය හෝ ප්‍රමාදය පිළිබඳව මතු කර ඇති කරුණු;

05. ඉහත කරුණු එකිනෙකට සම්බන්ධ කරමින් අගවිනිසුරුතුමාගේ පවුලේ වත්කම් සහ X-Press Pearl වන්දි ක්‍රියාවලිය අතර යම් සම්බන්ධතාවයක් හෝ අයුතු බලපෑමක් තිබිය හැකි බවට පාර්ලිමේන්තුවේදී හෝ වෙනත් ප්‍රසිද්ධ මාධ්‍ය තුළ ඉදිරිපත් වී ඇති චෝදනා,

යන කරුණු ඇතුළත් වේ.

මෙහිදී මා විශේෂයෙන් අවධාරණය කිරීමට කැමැත්තේ, ඉහත සඳහන් කරුණු කිසිවක් සත්‍ය බවට මා විසින් පූර්ව නිගමනයක් නොකරන බවයි. ඒවා මේ වන විට පාර්ලිමේන්තුවේදී මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද චෝදනා හා ප්‍රශ්න ලෙස පමණක් සැලකිය යුතුය.

එහෙත්, ශ්‍රී ලංකාවේ අධිකරණයේ ප්‍රධානියා වන අගවිනිසුරුතුමා සම්බන්ධයෙන් මෙවැනි බරපතළ චෝදනා පාර්ලිමේන්තුවේදී ප්‍රසිද්ධියේ ඉදිරිපත් වී ඇති අවස්ථාවක, ඒවා සම්පූර්ණයෙන් නොසලකා හැරීමද රටේ අධිකරණ පද්ධතියේ විශ්වාසනීයත්වයට හානිදායක විය හැකි බව මගේ අදහසයි.

එම චෝදනා සත්‍ය නම්, ඒවා ශ්‍රී ලංකාවේ නීතියේ ආධිපත්‍යය, අධිකරණයේ ස්වාධීනත්වය, විනිසුරුවරුන්ගේ ආචාරධර්ම සහ මහජන විශ්වාසය සම්බන්ධයෙන් ඉතා බරපතළ කරුණු වන බැවින්, ඒ පිළිබඳව බලය ඇති ස්වාධීන ආයතන මගින් නිසි පරීක්ෂණයක් සිදුකිරීම අවශ්‍ය වේ.

අනෙක් අතට, එම චෝදනා අසත්‍ය නම් හෝ සාක්ෂි රහිත නම්, ඒවා පාර්ලිමේන්තුව තුළ ප්‍රසිද්ධියේ ප්‍රකාශ වීමෙන් අගවිනිසුරුතුමාගේ පෞද්ගලික කීර්තියට මෙන්ම සමස්ත ශ්‍රී ලංකා අධිකරණ පද්ධතියේ ගෞරවයටද බරපතළ හානියක් සිදුවිය හැකිය. එවැනි අවස්ථාවකදී සත්‍ය තත්ත්වය පැහැදිලි කිරීම මහජන විශ්වාසය ආරක්ෂා කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.

විශේෂයෙන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් පාර්ලිමේන්තු වරප්‍රසාද යටතේ හෝ සභා ගර්භය තුළ ප්‍රකාශ කරනු ලබන කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ වගකීම පිළිබඳවද මෙහිදී අවධානය යොමු කළ යුතුය.

ඒ අනුව, ඔබතුමාගෙන් පහත කරුණු සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

01. ඉහත සඳහන් චෝදනා හෝ ඒ හා සමාන කරුණු සම්බන්ධයෙන් කුමණ හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විසින් පාර්ලිමේන්තුවට හෝ ඔබතුමාට කරුණු ඉදිරිපත් කර හෝ ඒ සම්බන්ධයෙන් සාක්ෂි හෝ ලේඛන සභාගත කර තිබේද?

02. එසේ ඉදිරිපත් වී ඇත්නම්, ඒ සම්බන්ධයෙන් ඔබතුමා විසින් මේ වන විට කිසියම් මූලික පරීක්ෂණයක්, විමසීමක් හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද?

03. පාර්ලිමේන්තුව තුළ මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කර ඇති මෙම චෝදනා සම්බන්ධයෙන්, ඒවා සත්‍යද අසත්‍යද යන්න තහවුරු කර ගැනීම සඳහා අදාළ නීතිමය බලය ඇති ස්වාධීන ආයතන වෙත කරුණු යොමු කර තිබේද?

04. විශේෂයෙන් අගවිනිසුරුතුමාගේ හෝ ඔහුගේ පවුලේ සාමාජිකයන්ගේ වත්කම් හා දේපළ සම්බන්ධයෙන් මතු කර ඇති කරුණු, නීතිය යටතේ විමර්ශනය කිරීමට බලය ඇති ආයතනයක් වෙත යොමු කර තිබේද?

05. X-Press Pearl නඩුව හා ශ්‍රී ලංකා රජයට හිමිවිය යුතු වන්දි මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව තුළ මතු කර ඇති කරුණු පිළිබඳව රජයේ අදාළ ආයතනවලින් හෝ නීතිපති දෙපාර්තමේන්තුවෙන් කිසියම් නිල පැහැදිලි කිරීමක් ලබාගෙන තිබේද?

06. ඉහත චෝදනා සත්‍ය නොවන බව තහවුරු වුවහොත්, අගවිනිසුරුතුමාගේ සහ ශ්‍රී ලංකා අධිකරණ පද්ධතියේ ගෞරවය ආරක්ෂා කිරීම සඳහා පාර්ලිමේන්තුවේ මට්ටමින් ගත හැකි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු වී තිබේද?

07. එම චෝදනා සත්‍ය බවට විශ්වාස කිරීමට ප්‍රමාණවත් සාක්ෂි තිබේ නම්, නීතිය අනුව ඒ පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අදාළ බලධාරීන් වෙත කරුණු යොමු කිරීමට ඔබතුමා අදහස් කරන්නේද?

මාගේ මෙම ඉල්ලීම කිසිසේත්ම අගවිනිසුරුතුමාට හෝ ශ්‍රී ලංකා අධිකරණ පද්ධතියට අගෞරව කිරීමේ අරමුණින් නොවන අතර, චෝදනා සත්‍ය නම් සත්‍යය අනාවරණය කර නීතිය ක්‍රියාත්මක කිරීමත්, චෝදනා අසත්‍ය නම් ඒ බව පැහැදිලි කර අධිකරණයේ ගෞරවය හා මහජන විශ්වාසය ආරක්ෂා කිරීමත් අරමුණු කරගත් එකකි.

අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා එහි විනිසුරුවරුන්ට අයුතු බලපෑම්වලින් ආරක්ෂාව තිබිය යුතු අතරම, එම ස්වාධීනත්වය විනිසුරුවරුන් සම්බන්ධයෙන් විශ්වාසනීය හා සාක්ෂි මත පදනම් වූ චෝදනා කිසිදු පරීක්ෂාවකින් තොරව නොසලකා හැරීමට හේතුවක් නොවිය යුතුය.

එබැවින්, ඉහත කරුණු සම්බන්ධයෙන් ගරු ඔබතුමා විසින් මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ඉදිරියේදී ගැනීමට අපේක්ෂා කරන ක්‍රියාමාර්ග පිළිබඳව ලිඛිත පැහැදිලි කිරීමක් ලබාදෙන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

ස්තූතියි,

මෙයට විශ්වාසී,

**නීතිඥ දයාසිරි ජයසේකර**

කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී